1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/13/1 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2023.02. 13 |

දකුණු පළාතේ සියලුම

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ,

ගණන්දීමේ නිලධාරීන් වෙත,

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (රාජ්‍ය සේවා ආයතනවල ඉවතලන කඩදාසි එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය කිරීම)**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2022.12.28 දිනැතිව නිකුත් කර ඇති 06/2022 දරන චක්‍රලේඛය හා බැදේ. ඒ අනුව, දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් යටියන අත් කඩදාසි ආයතනයේ ඉල්ලීමට ප්‍රමුඛතාවය ලබා දී ඉතිරියක් වේ නම් සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව වෙත ලබා දීමේ පදනම මත, 2023.02.01 දින සිට මෙම චක්‍රලේඛ ලිපිය දකුණු පළාතට අදාළ කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දුන් බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/1/2/2023 හා 2023.02.08 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බව කාරුණිකව දැනුම් දෙමි. (ලිපියේ පිටපතක් අමුණා ඇත).

02. මාගේ අංක CSS/7/13/2/1 හා 2022.01.31 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි මෙම චක්‍රලේඛ පිළිබඳව ප්‍රධාන ලේකම් කාර්යාලයීය වෙබ් අඩවියේ මුදල් දෙපාර්තමේන්තුව යටතේ " ගරු ආණ්ඩුකාරතුමා විසින් දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා අනුමත කරන ලද චක්‍රලේඛ " යන්නෙහි ඇතුළත් කර ඇති බැවින් එය භාගත කිරීම සිදු කළ හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

දුරකථන - 091 – 4944007
ෆැක්ස් - 091 – 2232691
විද්‍යුත් තැපැල - depoffinance7@gmail.com

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number | G/SP/1/1/2/2023 | ඔබේ අංකය / உமது இல. / Your Number | | දිනය / திகதி / Date | 2023.02. 08 |

09 FEB 2023

ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

**දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (රාජ්‍ය සේවා ආයතනවල ඉවතලන කඩදාසි එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම**

උක්ත ශීර්ෂයෙන් යුතුව මා වෙත යොමු කරන ලද ඔබේ අංක CSS/7/13/1 හා 2023.01.31 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව, දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් යටියන අත් කඩදාසි ආයතනයේ ඉල්ලීමට ප්‍රමුඛතාවය ලබා දී ඉතිරියක් වේ නම් සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව වෙත ලබාදීමේ පදනම මත, රාජ්‍ය සේවා ආයතනවල "ඉවතලන කඩදාසි එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම" මැයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 06/2022 දරන චක්‍රලේඛ ලිපිය 2023.02.01 දින සිට බලාත්මක වන පරිදි දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා **2023.02.06** දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

**ජයන්ත ජී. ලියනගේ**
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් වෙනුවට

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk